# සභ්‍යත්වයේ යටත්විජිතවාදය

මහාවිහාරික භික්ෂූන් වහන්සේ විසින් කරගෙන එන ලද්දේ අතීතයේ සිට ම මෙරට පැවති සම්ප්‍රදායක් ඉදිරියට ගෙන යෑම විය යුතු ය. ඒ පිළිබඳ නිශ්චිත සාක්ෂි නොමැති වුවත් පස්වැනි සියවස පමණ වන තෙක් මෙරට පැවති තාක්ෂණය සමග බැඳුණු දර්ශනයක්, විද්‍යාවක්, ශාස්ත්‍රීය සම්ප්‍රදායක් මෙන් ම කලා ශිල්ප ද අපට හඳුනාගත හැකි ය. වැවයි දාගැබයි පමණක් ඉදිවුණු සංස්කෘතියක් නොව ඉහත සඳහන් සියල්ලත් සමග බැඳුණු සංස්කෘතියක් හා චින්තනයක් අපට තිබූ බව පැහැදිලි ය. එය භාරතය සමග බැඳුණු එහෙත් භාරතයෙන් ස්වාධීන සංස්කෘතියක් හා චින්තනයක් වූ බවත් එපමණට ම පැහැදිලි ය.

අතීතයේ සිට මෙරට පැවති සම්ප්‍රදායක් යනුවෙන් අදහස් කෙරෙන්නේ ආර්යයන් හෙවත් අර්ධ වෛදිකයන් ක්‍රිස්තු පූර්ව නවවැනි සියවසේ දී පමණ මෙරටට පැමිණීමට පෙර සිට ම පැවත එන සම්ප්‍රදායකි. එවකටත් මෙරට තිබූ සංස්කෘතියක් ගැන මෙයින් කියැවෙයි. ඒ සංස්කෘතිය දඹදිව සංස්කෘතීන් සමග සම්බන්ධකම් පවත්වන්නට ඇත. අතීතයේ දී දඹදිව හා ලංකාව එකට යාවී තිබූ බවට සාක්ෂි වෙයි. එකල ඒ ඒ සංස්කෘතීන් අතර සම්බන්ධකම් නොතිබෙන්නට හේතුවක් නැත.

මෙරට සංස්කෘතිය ගැන අධ්‍යයනය කිරීමේ දී පැහැදිලිවන කරුණ නම් අප සංස්කෘතිය හා දඹදිව සංස්කෘතීන් අතර ඇති සම්බන්ධය ය. ඒ ඒ සංස්කෘතීන් අතර සමානකම් මෙන් ම අසමානකම් ද වෙයි. යුරෝපය ගැන ද එවැන්නක් කිවහැකි ය. යුරෝපයේ, එංගලන්තයේ සිට නෝර්වේ හා ස්වීඩන් වැනි ස්කැන්ඩිනේවියානු රටවල් දක්වාත්, ප්‍රංශය ජර්මනිය ඔස්සේ ඉතාලිය හා ග්‍රීසිය දක්වාත් ඇති සංස්කෘතීන් අතර සමානකම් මෙන් ම අසමානකම් ද දක්නට හැකි ය.  එසේම නැගෙනහිර යුරෝපයේ රටවල් අතර ද ඒ රටවලට ආවේණික වූ සමානකම් හා අසමානකම් වෙයි.

ලෝකයේ විවිධ කලාපවල සංස්කෘතික පවුල් ඇති බව පැහැදිලි ය. බටහිර උගත්තු සභ්‍යත්වය නමින් වූ සංකල්පයක් ගැන කතාකරති. ඔවුන්ට අනුව මානවයන් ලෙස හැරුණු විට ඉතා වැඩි ප්‍රමාණයක් අයත්වෙන ලෙස මිනිසුන් වර්ගකළ හැක්කේ සභ්‍යත්වය යන සංකල්පය යටතේ ය. සභ්‍යත්වය යන්න ඉංගිරිසි සිවිලිසේෂන් (civilisation) යන වචනයේ පරිවර්තනයකි. මිනිසුන් ශිෂ්ටවීම වැනි අදහසක් සභ්‍යත්වය හෙවත් සිවිලිසේෂන් යන්නෙහි ගැබ් වී ඇත.

සභ්‍යත්වය යන්න බටහිරයන්ගේ සංකල්පයක් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. කලකට පෙර ඔවුන්ට යුරෝපීයයන් හැරුණු විට අනෙක් සියල්ලෝම අශිෂ්ට වූහ. ඔවුන් ශිෂ්ට යනුවෙන් හැඳින්වූයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ඇතුල් වූ අය හා පැරණි ග්‍රීක හා රෝම සංස්කෘතිවලට අයත්ව සිටි ජනයා ය. එහෙත් කල්යෑමේ දී බටහිර මානවවිද්‍යාවට තමන් පමණක් ශිෂ්ට යැයි සැලකීමට නොහැකි බව පෙනී ගියේ ය. තම යටත්විජිතවල ද කලා ශිල්ප හා තාක්ෂණය පිළිබඳ කරුණු අනාවරණයවත්ම අනෙක් රටවල ද ශිෂ්ට මිනිසුන් ජීවත්වන බව හා ජීවත්ව සිට ඇති බව ඔවුන්ට පෙනී ගියේ ය. සභ්‍යත්වය යන්න අනෙක් රටවල ජනයාගේ ද ලක්ෂණයක් බව බටහිරයන්ට පසුව පිළිගැනීමට සිදුවිය.

සභ්‍යත්වය යන වචනයෙහි යටත්විජිතවාදී ලක්ෂණ තිබෙන බව අපට දැන් වැටහෙයි. බටහිර මානවවිද්‍යාවෙන් ලැබෙන මේ සංකල්පය අප ද ඇතැම්විට යොදාගෙන ඇති මුත් බටහිර සංස්කෘතියෙහි නිර්මාණය වී ඇති ඒ සංකල්පයෙන් වැරදි අදහස් ගෙන ඒමට ඉඩ ඇත. මේ සංකල්පයෙහි මිනිසුන් සභ්‍ය නොවූ හෙවත් සිවිලයිස්ඩ් යන ගණයට අයත් නොවූ යුගයක් ගැන ද කියැවෙයි. මුල දී බටහිරයන්ට ඔවුන් ඇමරිකාවට යෑමට පෙර එහි සිටි ජනතාව සභ්‍ය නොවූහ. මායා වැනි ශිෂ්ටාචාර හෙවත් සභ්‍යත්ව එහි තිබී ඇති බව පසුව බටහිරයෝ දැනගත්හ. (ශිෂ්ටාචාර යන පදය ද සභ්‍යත්ව යන අදහස ම ගෙන එයි. මේ වචන දෙකම සිවිලිසේෂන් යන ඉංගිරිසි වචනයේ පරිවර්තන ලෙස නිර්මාණය කෙරුණු වචන ය. අද ඇතැම්විට ඒ වචන සඳහා වෙනස් අර්ථකථන දීමට ඇතැමුන් තැත්කරනු පෙනේ.)

බටහිර මානවවිද්‍යාව යනු බටහිරයන්ට සාපේක්ෂව මිනිස් වර්ගයා ගැන අධ්‍යයනකිරීමෙන් ලබාගත් දැනුම් පද්ධතියකි. මුල දී තමන්, පැරණි ග්‍රීකයන් හා රෝමයන් පමණක් ශිෂ්ට ලෙස සැලකූ ඔවුහු පසුව ඒ සංකල්පය දිගින් දිගට ම ඒ

© Prof. Nalin De Silva

අර්ථයෙන් පමණක් යොදාගැනීමට නොහැකි බව තේරුම්ගෙන ලෝකයේ වෙනත් ජනතාව ද සභ්‍ය වූ හෙවත් ශිෂ්ට වූ යන වර්ගයට ඇතුල් කළහ. සභ්‍යත්වය යන සංකල්පය නිර්මාණය වූයේ පැරණි රෝමය ඔස්සේ යැයි කිවහැකි ය. රෝමයේ ශිෂ්ට නොවූ යන අර්ථය ඇති බාර්බේරියන් නම් වචනය වෙනත් ගෝත්‍ර හා ජනවර්ග වෙනුවෙන් යෙදිණි.

සංස්කෘතිය යන වචනය ද බටහිරයන්ගේ කල්චර් (culture) යන්න පරිවර්තනය කිරීමෙන් ලබාගත්තකි. එහෙත් සංස්කෘතිය යන වචනයෙහි යටත්විජිතවාදී ලක්ෂණ නැත. තමන් විසින් නිර්මාණය කළ , ඇති දැඩි කළ, වර්ධනය කළ ආදී අදහස් සංස්කෘතිය යන වචනයෙහි ඇත. ඕනෑම ජනවර්ගයකට සංස්කෘතියක් ඇත. එයට හේතුව ඕනෑම ජනවර්ගයක් සත්වයන් ලෙස තමන්ට පෛවීය ව උරුම වී ඇති ගති ලක්ෂණවලට ඔබ්බට යන යම් යම් ලක්ෂණ නිර්මාණය කර වර්ධනය කරගෙන ඇති බැවිනි. වැද්දන්ට (අද ජීවත්වන වැද්දන් නොවේ) ද සංස්කෘතියක් තිබිණි. ඔවුන්ගේ ජීවන රටාව සතුන්ගේ ජීවන රටාවට වඩා වෙනස් ය. ඔවුන් විසින් නිර්මාණය කරනු ලැබූ ගති පැවතුම් ඔවුන්ට තිබිණි.

එහෙත් බටහිර අර්ථකථන අනුව පැරණි වැද්දන්ට සභ්‍යත්වයක් තිබිණි ද යන්න ප්‍රශ්නයකි. පැරණි වැද්දන් සභ්‍ය වී ද යන ප්‍රශ්නය ඇසිය හැකි ය. එමෙන් ම ප්‍රශ්නයට පිළිතුරු ලෙස වැද්දන් සභ්‍ය නොවී යැයි ද ඔවුන් සභ්‍යත්වයකට අයත් නොවී යැයි ද බටහිරයන්ට කිව හැකි ය. අද ජිවත්වන වැද්දන් සම්බන්ධයෙන් ඒ ප්‍රශ්නය මතු නොවන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් අද සිංහල සංස්කෘතිය වැළඳ ගෙන ඇති බැවිනි. අවුරුදු දෙදහසකට වැඩි කාලයක් සිංහලයන් සමඟ ජීවත් වුව ද සිංහලයෝ බටහිර අර්ථයෙන් වැද්දන් “ශිෂ්ට” නො කළහ. එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වැද්දන්ට ද දැනෙන්නට වීමේ ප්‍රතිඵලය වී ඇත්තේ වැද්දන් සිංහල සංස්කෘතියට ක්‍රමයෙන් ආකර්ෂනය වීම ය. වැද්දන් සිංහල සංස්කෘතියට ඇතුල් කරනු ලබන්නේ සිංහලයන් විසින් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසිනි.

ඉහත සඳහන් කරුණුවලින් පෙනී යන්නේ සංස්කෘතිය යන්න අපට යොදාගත හැකි වචනයක් වුවත්, එනම් අපට බටහිරයන්ගෙන් අවශෝෂණය කරගත හැකි සංකල්පයක් වුවත්, සභ්‍යත්වය යන්න එසේ නොවන බව ය. සභ්‍යත්වය යන්නෙන් කියැවෙන සියල්ල නැතත් ඉන් ඇතැම් දේ ද වෙනත් අපට අවශ්‍ය දේ ද ඇතුළත් කරගනිමින් සංස්කෘතික පවුල යන සංකල්පය නිර්මාණය කරගත හැකි ය.

සභ්‍යත්ව ගැටුම හෙවත් ක්ලෑෂ් ඔෆ් සිවිලිසේෂන්ස් (clash of civilisations) නමින් පොතක් ලියූ පසුගිය දා මියගිය සැමුවෙල් හන්ටිංග්ටන් මහතාට බටහිර අර්ථයෙන් වුවත් සභ්‍යත්ව හඳුනාගැනීමේ අපහසුතාවක් විය. මානව වර්ගයා විවිධ සභ්‍යත්වවලට බෙදූ හන්ටිංග්ටන් මහතාට ලෝකයේ ථෙරවාදී රටවල ජනයා ඇතුළත් කරන්නේ කිනම් සභ්‍යත්වයකට ද යන ගැටළුව මතුවිය. ඒ මහතා ලෝකයේ ථෙරවාදී බෞද්ධයන් කිසිම සභ්‍යත්වයකට ඇතුල් නොකිරීමට වග බලාගත්තේ ය.

හන්ටිංග්ටන් මහතා ඇතුළු බටහිරයන්ට අනුව සභ්‍යත්වයක වූ ජනකායකට ඒ සියල්ලන් තමන්ගේ ය යන හැඟීම තිබිය යුතු ය. එහෙත් ඒ හැඟීම ථෙරවාදී රටවල ජනයා අතර නැතැයි හන්ටිංග්ටන් මහතා පෙන්වා දෙයි. එබැවින් ඔහු ථෙරවාදී රටවල බෞද්ධයන් එකම සභ්‍යත්වයකට අයත්යැයි නො පිළිගනියි. මෙහි දී ප්‍රශ්න කිහිපයක් පැන නගියි. ඒ ප්‍රශ්න සියල්ල බටහිරයන්ගේ සභ්‍යත්වය පිළිබඳ අර්ථකථනය සම්බන්ධයෙනි. පළමුවෙන් ම සභ්‍ය යන්නෙහි අදහස පිළිබඳ ප්‍රශ්නයක් වෙයි. අපි ඒ ප්‍රශ්නය ඉහත සාකච්ඡා කෙළෙමු. දෙවැනුව සභ්‍යත්වය හා සංස්කෘතිය අතර ඇති සම්බන්ධය ය. තුන්වැනුව සභ්‍යත්වය යන්නෙන් මානවයා යන්න හැරුණු විට ගතහැකි විශාලම ජන කොටස ලබා දෙන්නේ ද යන්න ය. හතරවැනුව සභ්‍යත්වයකට අයත් ජනයා තමන් සියල්ලන් ම තමන්ගේ ය යන අදහසින් පිළිගන්නේ ද යන්න ය.

ඉතා පැහැදිලිව බටහිරයන් සභ්‍යත්වය යන වචනය නිර්වචනය කර ඇත්තේ, එනම් එයට අර්ථකථනයක් සපයා ඇත්තේ බටහිර යුරෝපීයයන් එකම සභ්‍යත්වයකට අයත්වන ලෙස සැලකීමට හැකිවන පරිදි ය. බටහිර යුරෝපීයයන් පමණක් නොව ඒ රටවලින් ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ඇමරිකාව, කැනඩාව, දකුණු අප්‍රිකාව ආදී රටවලට ගොස් නිර්මාණය කෙරුණු ජාතීන් ද තම තමන් එකම පවුලකට අයත්වන්නන් ලෙස සලකනු දැකිය හැකි ය. ඒ ඒ රටවල

© Prof. Nalin De Silva

සංස්කෘතීන් අතර යම් යම් වෙනස්කම් තිබුණ ද ඒ සියල්ල පොදුවේ ගෙන යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලෙස හැඳින්වීමේ හැකියාවක් ඇත. ථෙරවාද බෞද්ධ රටවල සංස්කෘතීන් අතර සාම්‍යයක් ඇතත් ඒ රටවල ජනයා තම තමන් එකම පවුලක් ලෙස නො සළකන බව පැහැදිලි ය.

හන්ටිංග්ටන් මහතාට හා අනෙක් බටහිරයන්ට අනුව ථෙරවාද රටවල් එකම සභ්‍යත්වයකට අයත් නොවන්නේ නම් හා ඔවුන් කිසිම සභ්‍යත්වයකට අයත් නොවන්නේ නම් ඉන් පෙන්නුම් කරන්නේ එක්කෝ ඒ රටවල මිනිසුන් සභ්‍ය නොවන බව ය. නැතහොත් බටහිරයන්ගේ සභ්‍යත්වය යන සංකල්පයේ අඩුවක් හෝ වරදක් හෝ ඇති බව ය. ඇතැම් විට මේ සියල්ල පිටුපස ඇත්තේ බටහිරයන්ට ථෙරවාදී රටවල ජනතාව සභ්‍ය යැයි පිළිගැනීමට ඇති අකමැත්ත විය හැකි ය. එසේත් නැතහොත් බටහිර දැනුම් පද්ධතියට එරෙහිව දැනුම් පද්ධතියක් නිර්මාණය කළ හැක්කේ ථෙරවාදී බෞද්ධයනට පමණක් වීම යන්න ඒ පසුපස තිබෙන්නට හැකි ය.

ඒ කෙසේ වෙතත් අපට මෙහි දී පිළිගැනීමට සිද්ධවන කරුණ නම් ථෙරවාදී බෞද්ධ රටවල් අතර බටහිර යුරෝපයේ රටවල මෙන් අපේ කමක් නැති බව ය. මියන්මාරයේ සිද්ධවන්නේ කුමක් ද යන්න පිළිබඳව සොයා බැලීමටවත් ලංකාවේ ථෙරවාදීන් වූ අපට අවශ්‍යතාවක් නැත. එරට බෞද්ධ විරෝධීව කටයුතු කරන්නේ ආණ්ඩුව ද එසේත් නැත්නම් බටහිරයන්ගේ සම්මානනයට පත් වූ අවුං සාන් සුකී ද යන්න අපි සොයා නො බලමු. ලාඕසයේ ථෙරවාදී බෞද්ධයන් සිටින බවවත් අපි බොහෝ දෙනෙක් නො දනිමු. එහෙත් එපමණකින් ථෙරවාදී බෞද්ධයන් කිනම් අර්ථයකින් වුව ද කිසිම සභ්‍යත්වයකට අයත් නැතැයි කියන්නේ කෙසේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva